**කළුතර නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවේ 2.2.1(ආ) හි ඡේදයේ අනුව කලින් ලැබීම් ගිණුම්ගත කර නොතිබීම නිවැරදි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදල හර කර ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ශීර්ෂ බැර විය යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.781,827 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2013 සහ 2014 වර්ෂවලට අදාලව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.38,508,455 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම් ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයට අදාලව රඳවාගත් වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් රු.6,050,167 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) මහජන බැංකුවේ හා ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු 02 ක් සඳහා ලැබිය යුතු පොලී රු.47,450 ක් වැඩියෙන් ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල වැය විෂයයන් 4 ක එකතුව රු.259,650 ක් වූ වියදම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් තබා නොතිබූ අතර ඒ හේතුවෙන් වර්ෂයේ වියදම හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල රු.1,485,469 ක් වූ ප්‍රාග්ධන ආධාර සහ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන ආදයම් හා වියදම් යටතේ දක්වා තිබුණි.

(උ) 2015 වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග කරන ලද පිළිවෙලින් වටිනාකම රු.2,000,000 ක් හා රු.16,695,000 ක් වූ Foton Cab රථයක් හා Foton බැකෝ ලෝඩරයේ හා වටිනාකම තක්සේරු නොකරන ලද Single drum vibrating roller යේ අයිතිය සභාව වෙත පවරාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

සමාලෝචිත වර්ෂය අවසානයට රු.14,703,849 ක් වූ අතැති ගබඩා ද්‍රව්‍ය තොගය සඳහා උපලේඛන ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.40,755,710 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,778,582 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.32,233,369 ක් වූ හිඟ ආදායම් නගර සභා ආඥා පනතේ (255) අධිකාරියේ 160, 165, 170 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2.2.2 <u>වරිපනම් බදු</u>

(අ) 2015 වර්ෂයේ තක්සේරු ආදායම රු. 24,108,640 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉන් රු.14,865,586 ක් එනම් සියයට 62 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.26,711,621 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.9,707,276 ක් එනම් සියයට 36 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.3 <u>කර්මාන්ත බදු</u>

2014 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු ශේෂය රු.36,950 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.13,250 ක් එනම් සියයට 36 ක් පමණක් අයකරගෙන තිබුණි.

## 2.2.4 විනෝද බදු

2015 වර්ෂයේ තක්සේරු ආදායම රු. 4,473,294 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.2,608,534 ක් එනම් සියයට 58 ක් පමණක් අයකරගෙන තිබුණි.

## 2.2.5 තානායම් කුලී

2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.745,035 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉන් රු.74,750 ක් එනම් සියයට 10 ක් පමණක් අයකර ගෙන තිබුණි.

## 2.2.6 බලපත්‍ර ගාස්තු

2014 නොවැම්බර් 14 දිනැති අංක 1889 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ පළ කර ඇති පරිදි කළුතර නගර සභා බල ප්‍රදේශය තුළ 1968 අංක 14 දරන සංචාරක පනතේ කාර්යය සඳහා, යම් හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තාවූද, අනුමත කර හෝ පිළිගත්තාවූද, අවස්ථාවක 2015 වර්ෂය සඳහා වූ බලපත්‍ර ගාස්තුව ලෙස එම හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන් පොලේ 2014 වර්ෂයේ සම්පූර්ණ ආදායමින් සියයට 1 ක මුදලක් පනවා අය කළ යුතුය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සියයට 1 ක බද්ද අයකිරීම සඳහා පෞද්ගලික ආයතන 05 ක් විසින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන විගණනය කරන ලද වාර්තා නොවන අතර අදාල ගණකාධිකරණ ආයතනය මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇත්තේ ආයතනය විසින් ඉදිරිපත් කළ වාර්තා හා තොරතුරු අනුව ගිණුම් ප්‍රකාශන සකස් කළ බවය. මේ අනුව මෙම ආයතනවල සියයට 1 කේ බද්ද ගණනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ආදායම පිළිබඳ විගණනයට සෑහීමකට පත් විය නොහැකි විය.

(ආ) 2014 වර්ෂයේ ආදායම පදනම් කරගෙන සියයට 1 අය කළ යුතු වුවත් පෞද්ගලික ආයතන 2014 හා 2015 මුල් මාස 3 සඳහා වූ කාලපරිච්ඡේදය සඳහා ආදායම් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2015 වර්ෂයට අදාල බද්ද නිවැරදි ආකාරයට ගණනය වී නොතිබුණි.

## 2.2.7 උසාවි දඩ

බාහිර පාර්ශව භාරයේ පවත්නා සභාවේ ආදයමක් වූ උසාවි දඩ, සභාව වෙත ගෙන්වා ගැනීමට 2012 වර්ෂයේ සිට සභාව විසින් කිසිදු උත්සාහයක් කර නොතිබුණි. ඒ සම්බන්ධ ලේඛණයක් හෝ සභාව නඩත්තු කර නොතිබීම නිසා සභාවට ලැබිය යුතු මුදල කොපමණද යන්න නිශ්චය කළ නොහැකි විය.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) ස්ථාන මාරු වී ගිය නිලධාරිණියකගේ රු.67,680 ක ණය ශේෂය විගණිත දිනය වූ 2016 ජනවාරි 20 දින වන විටත් අය නොවී පැවතුණු අතර මිය ගිය හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දින අයවීමට ඇති ණය ශේෂය රු.362,920 ක් විය.

(ආ) සභාවේ අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය පරීක්ෂා කිරීමේදී 2015 දෙසැම්බර් 31 දින සේවකයින් 18 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ඇ) සභාවේ ඇප තැබිය යුතු සේවකයින් 48 දෙනෙකුගෙන් එසේ ඇප මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2004 දෙසැම්බර් 15 දිනැති අංක LG/07/2004 දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 15 ඡේදයේ විධිවිධානවලට පටහැනිව පැය 2 කට වඩා වැඩි කාලයක් සැලසුම් කමිටුව පවත්වා නොතිබියදී රු.13,000 ක දීමනා ලබාගෙන තිබුණි.

(ඉ) 2002 වර්ෂයේ සිට 2013 දක්වා කාලයට අදාල සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ප්‍රමාද වී ගෙවීම මත රු.19,493 ක් වූ අධිභාර මුදලක් 2014 ඔක්තෝබර් 15 දින ගෙවා තිබුණි.

3.2 <u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

බැකෝ ලෝඩරයක් සහ ට්‍රැක්ටරයක් හා 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කිරීමට නියමිත වාහන 13 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 <u>කොන්ත්‍රාත් පාලනය</u>

(අ) <u>මගනැගුම ග්‍රාමීය මාර්ග</u>

මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2009 දෙසැම්බර් 24 දිනැති අංක HM/MG/03/01/Gen දරන චක්‍රලේඛයට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් රු.810,383 ක වියදමින් ඉදි කරනු ලැබ තිබූ මාර්ග 02 ක් සඳහා වන මුදල් ප්‍රතිපූර්ණය කිරීම සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) <u>කළුතර උතුර පන්සල පාර තාර දැමීම</u>

කළුතර උතුර පන්සල පාර දෙවැනි හරස්වීදියේ සිට විවේකාරාම පාරේ තුන්වන හරස් වීදිය දක්වා පාර තාර දමා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියද, අධි ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරියගේ උපදෙස් මත තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තාවකාලිකව වැඩ අත්හිටුවීමට පෙර ව්‍යාපෘතියේ ඉටු කර තිබූ වැඩ කොටස් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ගෙවීම් වාර්තා හා මිණුම් වාර්තා ඉදිරිපත් කර තිබුණද, ව්‍යාපෘතිය අධීක්ෂණය කළ හා ඇස්තමේන්තු සැකසූ කාර්මික නිලධාරි විසින් ඒවා පරීක්ෂා කර තහවුරු කිරීම් හා නිර්දේශයන් ලබා දී නොතිබුණි.

(ii) කර්මාන්තය පරීක්ෂා කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු හා කළුතර පලාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඉදිකිරීම්වල දුර්වලතා රාශියක් අනාවරණය කරගෙන තිබුණි.

3.4 **වාහන අලුත්වැඩියාව**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 සැප්තැම්බර් 19 දින හදිසි අනතුරකට ලක්වී තිබූ ගලි බවුසරය අලුත්වැඩියා කිරීම සඳහා රු.551,718 ක් සභා අරමුදලින් වැය කර තිබුණද රක්ෂණ වන්දි ලබා ගැනීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 සැප්තැම්බර් 24 දින JCB යන්ත්‍රය කසල අංගනයේදී අනතුරට පත්වී තිබූ අතර අළුත්වැඩියා කිරීමට රු.110,594 ක ඇස්තමේන්තුවක් පුද්ගලික සමාගමකින් ලැබී තිබුණද 2016 ජනවාරි 15 දින වන විටත් අදාල අලුත්වැඩියාවන් ඉටුකර නොතිබුණි.

(ඇ) ජල බවුසරය එන්ජිම අළුත්වැඩියා කිරීම සඳහා සතොස මෝටර්ස් වෙත ඉදිරිපත් කර තිබූ අතර එය රු.984,295 ක් වැය කර අළුතින් එන්ජින් කොටස් තබා තිබුණි. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්මික ඉංජිනේරුගේ නිර්දේශයකින් තොරව සතොස මෝටර්ස් හි ඇස්තමේන්තුවට අනුව මෙම අළුත්වැඩියාව සිදු කර තිබුණි.

(ඈ) සුනාමි ආධාර වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලද මහින්ද්‍රා වර්ගයේ ට්‍රැක්ටරය හා නිසාන් වර්ගයේ ගිනි නිවන රථය විගණන දිනය වූ 2016 ජනවාරි 15 දින වන විටත් ලියාපදිංචි කර නොතිබූ අතර සභාවේ වාහන අංගනයේ දිරාපත්වෙමින් පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.5 **නිශ්කාර්ය වත්කම්**

පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන වැඩසටහන 2007 යටතේ ප්‍රතිපාදන අනුමත කර තිබූ සෞඛ්‍ය අංශයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා 2016 ජනවාරි 12 වන විට බිම් මහලෙහි මූලික සැකිල්ල පමණක් ඉදි කර තිබුණි. අතර එම කොටස වාහන නවතා තැබීමට යොදාගෙන තිබූ අතර වර්ෂ 08 කට අධික කාලයක් නිශ්කාර්යව තිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වාහන පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ව්‍යාපෘති පාලනය

(ඊ) අයවැය පාලනය